**වත්තල ප්‍රාදේශීය සභාව - 2022**

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

වත්තල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයට අදාළ පුනරාවර්ථන නොවන වියදම් සඳහා රජයෙන් කල මාරුකිරීම් රු.70,977 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහන් මඟින් ගැලපීම් සිදුකර ඇත. සංශෝධිත අවසන් ගිණුමේ සටහන් වල දක්වා ඇති බව. | ජර්නල් සටහන් නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් විස්තීර්ණ ආදායම ගණනය කිරීමේදී අතිරික්තයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් රු.70,977 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගතිමි. | නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) | 2020 හා 2021 වර්ෂයන්ට අදාල විගණන ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ ගෙවා රු.1,157,742 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හර කර තිබුණි | අදාල විගණන ගාස්තු බිල්පත් ලැබුනේ 2022 වර්ෂයේ බැවින් 2022 වර්ෂයේ වැය ශීර්ෂය යටතේ මෙම ගෙවීම සිදුකර ඇති බව. | උපචිත පදනම මත නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2. නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනය අනුව අවසන් තොගය රු.12,239,967 ක් වුවද, උපලේඛනය අනුව ශේෂය රු.13,040,739 ක් වූයෙන් රු.800,772 ක වෙනසක් විය. | තොග ගබඩා ගිණුම භෞතික අගය එසේම පවතින බව. | වෙනස් කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | හිඟ අදායම් කාල විශ්ලේෂණය අනුව වරිපනම් ශේෂය රු. 88,190,603 ක් වුවද, හිඟ අදායම් වාර්තාව අනුව ශේෂය රු. 83,978,080 ක් වූයෙන් රු.4,212,523 ක වෙනසක් විය. | නෙක්ෆා පරිගණක පද්ධතියට අනුව ශේෂය හා ගිණුම් පොත් අනුව ශේෂය වෙනසක් පවතී. නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ගොඩනැගිලි ලෙජර් ගිණුම අනුව ශේෂය රු.460,498,734 ක් වුවද, වත්කම් වගකීම් ප්‍රකාශනයේ ශේෂය රු.460,016,319 ක් වූයෙන් රු.482,415 ක වෙනසක් විය. | වෙනස සම්බන්ධයෙන් පරීක්ෂා කරන බව. | -එම- |

## 1.7 අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24(1)ආ වගන්තිය | සභාවට අයත්ව තිබූ මාර්ග 1,190 ක් ගැසට්පත්‍රය මගින් ප්‍රසිද්ධ කර පවරාගැනීමට කටයුතුකර නොතිබුණි | වාර්ෂිකව ප්‍රතිපාදන වෙන්කර මාර්ග මැනීම් සිදුකරන අතර එම මාර්ග ගැසට් කිරීමට කටයුතු කරන බව. | පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ii) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනත | දේපල 61,489 ක් 2008 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන බිල් කර තිබුණි. | ඉදිරියේ දී වරිපනම් තක්සේරුවක් කිරීමට කටයුතු කරන බව. | නව වරිපනම් බදු රේටයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | 571(1) හා (2) | වටිනාකම රු.589,378 ක් වූ තැන්පතු 79 ක් නියාදනය කර නොතිබුණි. | මෙම තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරන බව. | වසර දෙක ඉක්මවූ තැන්පතු ශේෂ නියාදනය කළයුතුය. |
| | 371 | 2019 ජූලි 06 දින ලබාදී තිබුණු වටිනාකම රු.112,420 ක් වූ අත්තිකාරම් පියවාගෙන නොතිබුණි. | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කරන බව. | අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.263,219,162 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.120,504,997 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 94,142,100 | 105,796,333 | 107,098,725 | 83,978,079 | 93,667,000 | 96,216,178 | 84,629,100 | 85,280,471 |
| (ii) | කුලී | 5,640,000 | 11,698,138 | 11,839,872 | 8,596,534 | 6,950,000 | 7,278,297 | 7,028,665 | 8,738,268 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,352,399 | 2,637,349 | 2,637,349 | - | 3,400,000 | 2,750,099 | 2,750,099 | - |
| (iv) | වෙනත් ආදායම් | 765,000 | 2,518,182 | 2,518,182 | - | 1,020,000 | 3,873 | 3,873 | - |
| | | ------------ | ------------ | ------------ | ----------- | ------------ | ------------ | ------------ | ------------ |
| | | 103,899,499 | 122,650,002 | 124,094,128 | 92,574,613 | 105,037,000 | 106,248,447 | 94,411,737 | 94,018,739 |
| | | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== | ======== |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ වරිපනම් ශේෂය රු.85,280,471 කින් වර්ෂය තුල රු.27,760,342 ක් පමණක් අයකර තිබුණි. | පිළිගන්නා බව.ඉදිරියේ දී වැඩි ප්‍රතිශතයක් අයකිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව හිග වරිපනම් ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ කඩ කුලී ශේෂය රු.8,371,114 කින් වර්ෂය තුළ අය කර ගත් මුදල රු.3,167,419 ක් විය. | -එම- | ගිවිසුම් අනුව හිඟ වෙළඳ ස්ථාන කුලී ශේෂ අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.8,942,814 ක් විය. | ව්‍යාපෘතිවලට අදාල ගෙවීම් වාර්තා ආයතන වෙත යවා ඇතත් මුදල් ලැබී නොමැති බව. | ණයගැති ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත ණය හිමි ශේෂය රු.62,524,940 ක් විය. | ව්‍යාපෘති වෙනුවෙන් කොන්ත්‍රාත් කරුවන් වෙත ගෙවිය යුතු මුදල් ගෙවීම සිදුකරනුයේ මුදල් ලැබීමෙන් අනතුරුව බව. | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතුය. |

### 3.2. වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් රාජ්‍ය ආයතනවලින් සභාවේ පරිහරණයට ලැබී තිබූ වටිනාකම රු.36,193,861 ක් වූ වාහන 6 ක් 2023 අප්‍රේල් 23 දින වන විටත් සභාවට පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | පවරා ගත යුතුයි. |

### 3.3. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට , ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, මියගිය, සේවය හැරගිය වෙනත් හේතු මත නිලධාරීන් 29 දෙනෙකුගෙන් අයවීම් හිඟ හිටි සේවක ණය ශේෂය රු.1,188,867 ක්ව තිබුණි | ලිපි මඟින් දැනුවත් කර ඇතත්, අදාල මුදල් අයවී නොමැති බව. | සේවක ණය අයකර ගත යුතුය. |